**ශ්‍රී ලංකා කජු සංස්ථාව - 2017**

**---------------------------------**

ශ්‍රී ලංකා කජු සංස්ථාවේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1972 අංක 11 දරන රාජ්‍ය කෘෂිකර්ම සංස්ථා පනතේ 23 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා කජු සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

**ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ප්‍රමිතයෙහි 51 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් රු.20,623,892 ක් වූ වත්කම් සම්පූර්ණයෙන්ම ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රමිතයේ 74 වගන්තිය ප්‍රකාරව ණය සඳහා ඇපසුරුකුමක් ලෙස තබන ලද දේපළ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේ රු.10,000,000 ක ණය මුදලක් ලබා ගැනීම සඳහා ඇපසුරුකුමක් ලෙස තබන ලද පුත්තලමේ පිහිටි “වින්තකුඩරිප්පු වත්ත” පිළිබඳව හෙළිදරව් කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

මුළු ණයගැතියන්ගෙන් සියයට 3.53 ක් අඩමාණ ණය වෙන්කිරීම ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ හඳුනාගෙන තිබුණද වසර 05 ඉක්මවූ ණයගැතියන් සඳහා හානිකරන අලාභ හඳුනාගැනීම හෝ අඩමාණ ණය වෙන්කිරීම සංස්ථාව විසින් සිදුකර තිබුණි. කෙසේ වුවද, 2017 දෙසැම්බර් 31 දිනට විවිධ ණයගැති ශේෂ තුළ ඇතුලත් වසර 5 ඉක්මවූ රු.10,426,696 ක ණයගැති ශේෂ 07 ක් සඳහා හානිකරන අලාභ හඳුනාගැනීම හෝ අඩමාණ ණය වෙන්කිරීම සිදුකර නොතිබුණි.

#### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්‍රාම පාරිතෝෂික ප්‍රතිලාභ ආයු ගණනය කිරීමෙන් ලද රු.9,436,077 ක ආයු ගණන ලාභය සංචිත ලෙස පෙන්නුම් කිරීම වෙනුවට වර්ෂයේ ආදායමට එකතු කිරීම නිසා වර්ෂයේ ලාභය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) සංස්ථාවේ ක්ෂය ප්‍රතිපත්තිය අනුව අර්ධ ස්ථාවර ගොඩනැගිලි (Semi-Permanent Buildings) වර්ෂයකට සියයට 33 1/3 ක් ක්ෂය කළ යුතු වුවත් රු 537,670 ක වියදමක් දරා ඉදිකරන ලද තාවකාලික අලෙවි සැල වර්ෂයකට සියයට 3 ක් ක්ෂය කිරීම නිසා වර්ෂයේ ක්ෂය වීම රු. 163,075 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) 2017 දෙසැම්බර් 31 දිනට එළුවන්කුලම බීජ උද්‍යානය සහ කිරාන් සංචාරක බංගලාවේ ඉදිකිරීම්වලට අදාලව ඉංජිනේරුවරයාගේ සහතික කිරීම මත නිමවී ඇති වැඩ සඳහා කොන්ත්‍රාත්කරුට ගෙවිය යුතු එකතුව රු.4,934,221 ක් වූ මුදල මූල්‍ය ප්‍රකාශන වල කෙරීගෙන යන වැඩ ලෙස හා ගෙවිය යුතු වියදම් ලෙස දක්වා නොතිබුණි.

(ඇ) එළුවන්කුලම බීජ උද්‍යානයේ ඉදිකිරීමට අදාලව සමාලෝචිත වර්ෂයේදී කොන්ත්‍රාත්කරුගෙන් අඩු කරන ලද රැඳවුම් මුදල වූ රු. 109,440 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඉ) ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ මාසික කුලිය වූ රු. 375,000 ක මුදල ගෙවීමේදී රු.93,750 ක් තැන්පතු මුදලින් අඩුකර ගනු ලබන අතර 2016 සහ 2017 වර්ෂවල දෙසැම්බර් මාස දෙකෙහි එම අඩු කිරීම නොසලකා හැරීම නිසා ගෙවිය යුතු කුලී ගිණුමේ ශේෂය හා තැන්පතු ගිණුමේ ශේෂය රු. 187,500 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ නොවැම්බර් හා දෙසැම්බර් මාසවල සැපයුම්කරුවන් විසින් සපයා, භාණ්ඩ ලැබීම් පත්‍ර නිකුත්කර තිබූ එකතුව රු.1,007,325 ක් වූ වායු සමීකරණ 04 ක් සහ පරිගණක 05 ක් වත්කම් හා ගෙවිය යුතු ගිණුම්වලට ගෙන නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ මෝටර් රථ 03 ක දූණු සැකසීම, තිරිංග සැකසීම යනාදී අළුත්වැඩියා කටයුතු සඳහා දරන ලද රු. 1,016,765 ක් වියදම් යටතේ ගිණුම්ගත කිරීම වෙනුවට ප්‍රාග්ධනිත ගතකර තිබුණි.

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වී අලෙවි මණ්ඩලයට ගෙවිය යුතු වර්ෂ 5 ඉක්ම වූ රු. 3,500,000 ක ණය ශේෂය පියවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට ගෙවිය යුතු රු.1,699,709 ක් වූ විගණන ගාස්තු තුල වසර 10 ක් ඉක්මවූ රු.499,805 ක ශේෂයක්ද ඇතුලත් වන නමුත් මෙම ශේෂය නිරවුල් කිරීමට කටයුතු නොකර අඛණ්ඩව ගිණුම් වල දක්වා තිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසිවලට හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1958 අංක 15 දරන අර්ථ සාධක අරමුදල් පනතේ 15 වගන්තිය හා 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදල් පනතේ 16(1) වගන්තිය | පනතේ විධිවිධාන ප්‍රකාරව දායක මුදල් ඊළඟ මාසයේ අවසාන දිනට පෙර අරමුදල වෙත ගෙවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂයට හා පෙර වර්ෂවලට අදාලව අර්ථසාධක අරමුදලට සේව්‍ය සේවක දායකත්වය රු.242,873 ක් සහ සේවක භාරකාර අරමුදලේ දායකය රු.28,633 ක් 2017 දෙසැම්බර් 31 දිනටත් එම අරමුදල්වලට නොගෙවා අත රඳවාගෙන තිබුණි. |

| | | |
|---|---|---|
| (ආ) | 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත | පාරිතෝෂික දීමනාව දින 30 ක් ඇතුලත ගෙවිය යුතු වුවත් නිලධාරීන් තිදෙනෙකුට ප්‍රවර්තන වර්ෂය තුළ දින 13 සිට දින 47 දක්වා ප්‍රමාද වී එම දීමනාව ගෙවා තිබුණි. |
| (ඇ) | 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත හා 2009 අංක 9 දරන ජාතිය ගොඩනැගීමේ බදු පනත | භාණ්ඩ සපයන හා භාණ්ඩ නිෂ්පාදනය කරනු ලබන ආයතනයක් වන විටදී සහ කාර්තුවක පිරිවැටුම රු.මිලියන 3 කට වැඩි හෝ වාර්ෂික පිරිවැටුම රු.මිලියන 12 කට වැඩි වන විටදී එකතු කළ අගය මත බදු සහ ජාතිය ගොඩනැගීමේ බදු සඳහා ලියාපදිංචි විය යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (ඈ) | 2006 අංක 10 දරන දේශීය ආදායම් බදු පනත | සංස්ථාව ආදායම් බදු බැඳියාවට යටත් සංස්ථාවක් වන නමුත් 2011/2012 සිට 2016/2017 දක්වා තක්සේරු වර්ෂ 6 කට අදාල ආදායම් බදු ප්‍රකාශන සකස් කර ගෙවීම් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ඉ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371 හා 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 07 කදී ලබා දුන් එකතුව රු.76,890 ක් වූ තත්කාර්ය අතුරු අග්‍රිම 2018 අප්‍රේල් 30 දින වන විටත් පියවා නොතිබුණි. |
| (ඊ) | 2003 ජූනි 02 දිනැති අංක PED/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවත් එසේ කටයුතු කර නොතිබුණි. |

**2.5 ප්‍රමාණවත් අධිකාරී බලයකින් තහවුරු නොවූ ගණුදෙනු**

සංස්ථාව සතු නැදගමුව පිරි සැකසුම් මධ්‍යස්ථානයේ සේවකයන් වෙත ලබා දෙන ලද වර්ෂ 15 කට වඩා පැරණි අයකර නොගත් රු.31,219 ක උත්සව අත්තිකාරම් භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේ වියදමට කපාහැර තිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා සංස්ථාවේ මූල්‍ය ප්‍රතිඵලය රු.42,335,721 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.36,525,411 ක් වීමෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.5,810,310 ක වැඩිවීමක් නිරීක්ෂණය විය. වාණිජ අංශයේ දල ලාභය රු.5,489,581 කින් අඩුවීම මෙයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී , 2013 වර්ෂයේ රු.9,344,801 ක්ව පැවති ශුද්ධ අලාභය උච්ඡාවචනය වෙමින් 2017 වර්ෂයේදී රු.42,335,721 ක් වී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය වීම් නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු. 73,423,693 ක් වූ ධන දායකත්වය උච්ඡාවචනය වෙමින් 2017 වර්ෂයේදී රු. 83,261,486 ක් වී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක සමාලෝචනය

| | 2017 | 2016 |
|---|---|---|
| ජංගම අනුපාතය | 1.39:1 | 3.20: 1 |
| සාමාන්‍ය ණය පියවීමේ කාලය (දින) | 127 | 86 |
| දළ ලාභ අනුපාතය (සියයට) | 21 | 28 |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2016 වර්ෂයේදී ජංගම වත්කම් මගින් ජංගම වගකීම් ආවරණය කිරීමේ හැකියාව වාර 3.2 ක් වූ අතර 2017 වර්ෂයේදී එය වාර 1.39 දක්වා පහත වැටී තිබූ අතර සාමාන්‍ය ණය පියවීමේ කාලය දින 86 සිට දින 127 දක්වා වර්ධනය වී තිබුණි.

(ආ) දළ ලාභ අනුපාතය 2016 වර්ෂයට සාපේක්ෂව 2017 වර්ෂයේදී සියයට 7 කින් පහත වැටී තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී විකුණුම් පිරිවැය රු.11,535,029 කින් වැඩිවීම දල ලාභ අනුපාතය පහත වැටීමට හේතු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

සංස්ථාව විසින් කජු වගාව ව්‍යාප්ත කිරීම හා ජාතික නිෂ්පාදනය ඉහල නැංවීමේ අරමුණින් 2000 වර්ෂයේ සිට දිවයින පුරා කජු වගා සහනාධාර වැඩසටහනක් ක්‍රියාත්මක කර තිබුණු අතර ඒ සඳහා 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වර්ෂ 3 කදී එකතුව රු.191,152,222 ක් වැයකර තිබුණි. එම වැඩසටහන යටතේ පුත්තලම, කුරුණෑගල, අනුරාධපුර, වවුනියා හා මන්නාරම යන දිස්ත්‍රික්ක වල ගොවීන් වෙත 2014, 2015 හා 2016 වර්ෂවලදී කජුපැල එකතුව 304,640 ක් බෙදා දී තිබුණි. කෙසේ වුවද සංස්ථාවේ ලේඛනගත තොරතුරු අනුව 2017 වර්ෂයේදී නිරීක්ෂණය වී තිබුණේ බෙදාදුන් පැල වලින් පැල 143,325 ක් පමණක් ඉතිරි වී තිබූ බවය. එනම් ප්‍රගතිය සියයට 47 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් හා නොවැම්බර් මාසවලට අදාලව සංස්ථාවේ සේවක සුභසාධක සංගමයේ දායක මුදල් ලෙස එකතුව රු. 886,840 ක් නිලධාරීන්ගේ වැටුපෙන් අයකරගෙන තිබුණද 2017 දෙසැම්බර් 31 දිනටත් සංගමය වෙත ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 1982 අංක 03 දරන සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව ජීවන වියදම් දීමනාව සැලකිල්ලට ගෙන දායක මුදල් ගණනය නොකිරීම නිසා 2006 ජනවාරි සිට 2013 ජුලි දක්වා කාලයට අදාලව සමාලෝචිත වර්ෂයේදී රු. 1,138,508 ක අධිභාරයක් ගෙවීමට සිදු වී තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී ඉන් රු.569,253 ක් ගෙවා තිබුණි.

**4.3 වත්කම් පාලනය**

-------------------

හිටපු සභාපතිවරුන් වෙත ලබා දී තිබුණු වටිනාකම රු. 148,135 ක් වූ ජංගම දුරකතන 07 ක් නැවත සංස්ථාව වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

**4.4 ආර්ථික නොවූ ගනුදෙනු**

-----------------------------

අයිතිය සංස්ථාව සතු නොවූ වීරවිල පිහිටි ඉඩමක ප්‍රාදේශීය කාර්යාලයක් ඉදිකිරීම සඳහා රු.49,680 ක වියදමින් 2017 ඔක්තෝබර් 11 දින ලංසු කැඳවීමේ දැන්වීමක් පළකර තිබුණද, පසුව එහි ඉදිකිරීම් කටයුතු අත්හැර දැමීම නිසා එම වියදම නිෂ්ඵල වියදමක් වී තිබුණි.

**5. තිරසාර සංවර්ධනය**

----------------------

**5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟා කර ගැනීම**

------------------------------------------------

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව ශ්‍රී ලංකා කජු සංස්ථාව විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබුණි. එසේ දැනුවත් වී නොතිබීම හේතුවෙන් එහි කාර්යයන්ට සම්බන්ධ තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනාගෙන නොතිබුණි.

**6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

-----------------------------------------

**6.1. ප්‍රසම්පාදනයන්**

-----------------

මඩකලපුව කිරාන්හි සංචාරක බංගලාවේ භාවිතය සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.490,950 ක ගෘහභාණ්ඩ සහ රු.410,000 ක වායු සමීකරණ යන්ත්‍ර 04 ක් මිලදීගෙන තිබුණද එම මිලදී ගැනීම් වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම තුල ඇතුලත්ව නොතිබුණි.

**7. පද්ධති හා පාලනයන්**

------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සංස්ථාවේ සභාපතිවරයා වෙත යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) ගිණුම්කරණය | (i) ඇතැම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම.<br>(ii) ලෙජරය සඳහා ජ'නල් සටහන් ඇතුලත් කිරීමේදී මූල්‍ය බලතල පැවරී ඇති නිලධාරීන්ගේ අනුමැතිය ලබා නොගැනීම.<br>(iii) ජ'නල් සටහන් යෙදීමේදී ඊට අදාල උපකාරක ලියවිලි අමුණා නොතිබීම. |
| (ආ) වත්කම් පාලනය | (i) වාහන වල ඉන්ධන පරීක්ෂා කර සටහන් කර නොගැනීම.<br>(ii) වාහන ලොග් පොත් යාවත්කාලීනව පවත්වා නොගැනීම. |